C
374
DHA

# වැඩෙහි නිරත ගුරුවරුන් : ශිෂ්‍ය ප්‍රතික්‍රියා

## (මහනුවර දිස්ත්‍රික්කයේ තෝරාගත් පාසල් කිහිපයක් ඇසුරින් කරන අධ්‍යයනයක්)

# TEACHERS AT WORK : STUDENT REACTIONS

## (AN ETHNOGRAPHIC STUDY CONDUCTED IN A FEW SELECTED SCHOOLS IN THE KANDY DISTRICT)

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ අධ්‍යාපන අංශයේ
අධ්‍යාපන දර්ශනපති උපාධිය සඳහා ඉදිරිපත් කෙරෙන
පර්යේෂණාත්මක නිබන්ධනය

**1996/1997**

POSTGRADUATE UNIT
FACULTY OF ARTS
19 MAR 2004
UNIVERSITY OF PERADENIYA
PERADENIYA.

**ඩී. එම්. ඒ. එස්. ධර්මදාස**
ඉංග්‍රීසි (විශේෂ පුහුණු), විද්‍යාවේදී උපාධි (ඉංග්‍රීසි මාධ්‍යය)
පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා (විශිෂ්ට)
M.A. in Linguistics (English Medium)
English Diploma (Distant Education Service – Distinction),
Diploma in Advanced English for Administration & Academic Purposes

පර්යේෂණ උපදේශිකා
මහාචාර්ය පී. එච්. ඒ. එන්. එස්. ජයසේන මහත්මිය
අධ්‍යාපන විද්‍යා අංශය
පේරාදෙණිය විශ්ව විද්‍යාලය
පේරදෙණිය
ශ්‍රී ලංකාව.

588552

# සාරාංශය

ශ්‍රී ලංකාවේ මහනුවර අධ්‍යාපන දිස්ත්‍රික්කයේ, පාසල් තුනක් ඇසුරින්, පන්තිකාමරවල වැඩෙහි නිරත ගුරුවරුන් කෙරෙහි ශිෂ්‍යයන් හා ශිෂ්‍යාවන් විසින් දක්වන ප්‍රතික්‍රියාවල ස්වභාවය විමසා බැලීම අරමුණු කර ගත් මෙය මානව වංශ විධි විවරණ ක්‍රමය උපයෝගී කර ගත් පර්යේෂණයකි. පාසල් ස්වභාවයෙන් හා වර්ගයෙන් වෙනස්වූ එම එක් එක් පාසල්වල තෝරා ගන්නා ලද එක් ශ්‍රේණියකට විවිධ විෂයයන් ඉගැන්වීමෙහි නිරතව සිටි ගුරුවර ගුරුවරියන් වැඩෙහි නිරතව සිටි ස්වභාවය නිරීක්ෂණය කෙරුණු අතර, එහිදී ඔවුන් කෙරෙහි එම පන්තිවල ශිෂ්‍යයන් හා ශිෂ්‍යාවන් විසින් දක්වන ලද ප්‍රතික්‍රියාද නිරීක්ෂණය කෙරුණි. ඉන් අනතුරුව එම නිරීක්ෂණ අවස්ථා විශ්ලේෂණය කිරීම මෙහිදී සිදුවූ අතර, ඒ එක් එක් පන්තිවල ශිෂ්‍යයන් හා ශිෂ්‍යාවන් කිහිප දෙනෙකු සමග පවත්වන ලද අවිධිමත් සම්මුඛ සාකච්ඡා දත්ත මෙන්ම, අදාළ ලේඛනගත දත්ත ද උපයෝගී කර ගැනුණි. එමගින් දත්තවල විශ්වසනීයතාව හා වලංගුතාව රැක ගැනීමට පියවර ගැනුණි.

පන්තිකාමරවල වැඩෙහි නිරතවන ගුරුවරුන් කෙරෙහි ශිෂ්‍යයන් හා ශිෂ්‍යාවන් දක්වන ලද ප්‍රතික්‍රියා විමසා බැලීම සඳහා එසේ රැස් කර ගන්නා ලද දත්ත, ගුරුවරුන් වැඩෙහි නිරත වන ස්වභාවය, වැඩෙහි නිරත වන ගුරුවරුන් ආශ්‍රිත ශිෂ්‍ය ප්‍රතික්‍රියා, ශිෂ්‍ය ප්‍රතික්‍රියා ගුරු සිසු අන්තර්ක්‍රියාකරණය කෙරෙහි ඇති කරන බලපෑම යන අංශ ඔස්සේ විග්‍රහ කරන ලදී. ඒ අනුව පන්තිකාමරයෙහි වැඩෙහි නිරත ගුරුවරුන් එහි නියැලෙන ස්වභාවය හා ඔවුන් කෙරෙහි සිසුන් දක්වන ලද ප්‍රතික්‍රියා ආශ්‍රිතව කැපී පෙනෙන ලක්ෂණ කිහිපයක් හඳුනාගත හැකි විය.

1. එක් එක් පාසල්වල විවිධ විෂයයන් ඉගැන්වීමෙහි නිරත ගුරුවරුන් පන්තිකාමරවල වැඩෙහි නිරතවන ස්වභාවයේ වෙනස්කම් දක්වන බව හා එම වෙනස්කම් ඔවුන්ගේ පන්තිකාමර ව්‍යවහාර, ක්‍රියාකාරීත්වයන්, හැසිරීම් හා පුද්ගල ගුණාංග සමග සෘජු ලෙස සම්බන්ධ වන බව,

2. එහිදී වැඩෙහි නිරත වන ගුරුවරුන් පෙන්නුම් කරන්නාවූ එම වෙනස්කම් ඉගැන්වීම කෙරෙහි ඔවුන් දක්වන සූදානම, සැලසුම්කරණය, භාවිත කරන ඉගැන්වීම් ක්‍රම හා ඇගයීම් ක්‍රම, ගෙදර වැඩ ආශ්‍රිත පැවරුම් උපයෝගී කර ගන්නා ආකාරය මෙන්ම ගුරුවරයාගේ විෂය දැනුම, ඉගැන්වීමේ පැහැදිලිකම, සිසුන් කෙරෙහි දක්වන සැලකිල්ල හා උනන්දුව මෙන්ම ගුරු සිසු සබඳතා මතද රඳා පවතින බව,

3. ඒ අනුව පන්තිකාමර ක්‍රියාකාරීත්වයන්හි නිසි ලෙස නිරතවෙමින් මනා ලෙස ඉගැන්වීමෙහි නිරතවූ ගුරුවරුන් හා එයට ප්‍රතිවිරුද්ධ ලෙස, මනා ලෙස ඉගැන්වීමෙහි නිරත නොවූ ගුරුවරුන්ද දක්නට ලැබූ බව හා ඔවුන් කෙරෙහි එම පන්තිවල ශිෂ්‍යයන් හා ශිෂ්‍යාවන් ප්‍රතික්‍රියා දක්වන ලද බව,

4. ගුරුවරුන් කෙරෙහි ශිෂ්‍යයන් හා ශිෂ්‍යාවන් දක්වන ලද ප්‍රතික්‍රියා ආකාර කිහිපයකින් යුක්ත වූ බව හා මනා ලෙස ඉගැන්වීම ආශ්‍රිත ක්‍රියාකාරකම්හි නියැලුණු ගුරුවරුන් කෙරෙහි ධනාත්මක ශිෂ්‍ය ප්‍රතික්‍රියාත්, මනා ලෙස පන්තිකාමර ක්‍රියාකාරකම්හි නිරත නොවුනු ගුරුවරුන් කෙරෙහි සෘණාත්මක ශිෂ්‍ය ප්‍රතික්‍රියාත් ඇතිවූ බව,

5. ගුරුවරුන් ආශ්‍රිත ශිෂ්‍ය ප්‍රතික්‍රියා පාසල් ස්වභාවය අනුව යම් වෙනසක් පෙන්නුම් කළද ගුරුවරුන් උගන්වන විෂයය, ඔවුන්ගේ ස්ත්‍රි පුරුෂ භාවය හා ශිෂ්‍යයන්ගේ ස්ත්‍රී පුරුෂ භාවයට වඩා ගුරුවරයා මත රඳා පවතින බව,

6. ගුරුවරුන් කෙරෙහි ශිෂ්‍යයන් දක්වන ලද ප්‍රතික්‍රියා ගුරු සිසු අන්තර්ක්‍රියාකරණයෙහි තීරණාත්මක සාධකයක් වූ බවත් ඒ අනුව එම ප්‍රතික්‍රියා සමස්ත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියෙහිද තීරණාත්මක සාධකයක් වන බව,

7. පන්තිකාමරයෙහි වැඩෙහි නිරත ගුරුවරුන් කෙරෙහි ශිෂ්‍යයන් දක්වන ප්‍රතික්‍රියා ඔවුන්ගේ ජීවන රටාව හා පසුබිම සමග සබඳතාවක් පෙන්වන බව.

මේ අනුව ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ආශ්‍රිත පන්තිකාමර ජීවිතයේ යථාර්ථය හෙළි කිරීමට සමත්වූ මෙම අධ්‍යයනයෙන් අනාවරණය වූ තොරතුරු ඉහත සඳහන් කර තිබේ. එහිදී ගුරුවරුන්ගේ විෂයය දැනුම, පන්තිකාමර ක්‍රියාකාරීත්වය, හැසිරීම් හා ගුරු සිසු සබඳතා ආදියේ දුර්වලතා රැසක් අනාවරණය විණි. මෙම දුර්වලතා මග හැර සාර්ථක ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියක් සපුරා ගනු සඳහා පිළියම්ද යෝජනා විණි. ඒ අනුව ගුරුවරුන්ගේ විෂය දැනුම, වෘත්තීය දැනුම හා කුශලතා තවදුරටත් වර්ධනය කර ගැනීම සඳහා අඛණ්ඩ ගුරු පුහුණු පාඨමාලා හා ගුරු අධීක්ෂණ කටයුතු ක්‍රමවත්ව ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාව එහිදී යෝජනා විණි. ඊට අමතරව, මෙම කාර්යයන්හිදී විදුහල්පතිවරුන්, අධ්‍යාපන දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ නිසි අනුග්‍රහය, කැපවීම හා සාධාරණ ක්‍රියාකාරීත්වයද එහිදී අවධාරණය විණි.

තවද ඉගැන්වීම් ක්‍රියාවලියේ සාර්ථකත්වය අපේක්ෂා කරන්නේ නම් කාලසටහන් සැකසීමේදී හා පන්තිවල විවිධ විෂයයන් සඳහා ගුරුවරුන් පත් කිරීමේදී විදුහල්පතිවරයාගේ හෝ අනෙකුත් පාසල් ප්‍රධානීන්ගේ අභිමතයට වඩා ගුරුවරුන්ගේ විෂය දැනුම, හැකියා, දුර්වලතා, අත්දැකීම් හා අදාළ විෂයය කෙරෙහි රුචි අරුචිකම් ආදිය සැලකිල්ලට ගෙන එම කාර්යයන්හි නිරතවීමේ වැදගත්කමද මෙහිදී අවධාරණය කෙරුණි.

තවද ගුරුවරුන් කෙරෙහි සිසුන් දක්වන ලද ප්‍රතික්‍රියා සමස්ත ගුරු සිසු අන්තර්ක්‍රියාකරණය කෙරෙහිත්, ගුරු සිසු අන්තර්ක්‍රියාකරණය ශිෂ්‍යයා හා ඔහුගේ ඉගෙනුම කෙරෙහි ඇති කරන ප්‍රබල බලපෑමත් මෙහිදී අනාවරණය විණි. ඒ අනුව ගුරුවරයා විසින් ශිෂ්‍යයා ඔහුගේ අවශ්‍යතා, හැකියා, දුර්වලතා, රුචි අරුචිකම් හා පසුබිම් තොරතුරු මැනවින් හඳුනා ගැනීමේ අවශ්‍යතාව තහවුරු වූ අතර සිසුන් කෙරෙහි ගුරුවරුන්ගේ දයාව, කරුණාව හා සැලකිල්ල වැඩි වැඩියෙන් යොමු විය යුතු බවද තහවුරු විණි. මේ සඳහා වත්මන් පුහුණු පාඨමාලාවල අධ්‍යාපන මනෝ විද්‍යාව හා සමාජ විද්‍යාව වැනි විෂයයන් තවදුරටත් නවීකරණය විය යුතු අතර ගුරු ආකල්ප සැකසීමේ දැඩි අවශ්‍යතාවද යෝජනා කළ හැකිය.

මේ අනුව ගුරුවරුන් පිළිබඳ ශිෂ්‍යයන් දක්වන්නාවූ ප්‍රතික්‍රියා විශ්ව සංසිද්ධියක් බව පෙන්වා දිය හැකි අතර ගුණාත්මක පාසල් අධ්‍යාපනයක් සපුරා ගැනීම උදෙසා දරණ ප්‍රයත්නයන්හිදී තවදුරටත් පන්තිකාමර ජීවිතයේ විවිධ අංශ පිළිබඳ සිසු ප්‍රතික්‍රියා, සංජානනයන් හා අදහස් විමසා බැලීම වැදගත් වන බවද පැවසිය හැකිය. එහිදී මෙම අධ්‍යයනයේදී සැලකිල්ලට ලක් නොවූ අධ්‍යාපන දිස්ත්‍රික්ක, පාසල් වර්ග හා පර්යේෂණ ක්‍රම ඇසුරින් ගුරුවරුන් කෙරෙහි ශිෂ්‍ය ප්‍රතික්‍රියා ආශ්‍රිත අධ්‍යයනයන්හි නිරතවීම ඵලදායක විය හැකි බව අනාගත පර්යේෂණයන්හි නියැලෙන්නන් උදෙසා පැවසිය හැකිය.